# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2430/14 - 2025 අප්‍රේල් මස 01 වැනි අඟහරුවාදා - 2025.04.01

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

**2004 අංක 11 දරන මුදල් පනත**

2004 අංක 11 දරන මුදල් පනතේ 26 වැනි වගන්තිය සමග කියවිය යුතු 22 වැනි වගන්තිය යටතේ මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය අනුර කුමාර දිසානායක වන මම, 2023 ජනවාරි මස 01 වැනි දිනැති අංක 2312/80 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයෙන්* අවසන් වරට සංශෝධනය කරන ලද 2010 ජූලි මස 12 වැනි දිනැති අංක 1662/1 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* ප්‍රකාශයට පත් කරන ලද ජාත්‍යන්තර විදුලි සංදේශ ක්‍රියාකරු බද්ද (පැනවීම) නියෝගය එහි I වන උපලේඛනයේ අ, අ (i), ආ, ඇ සහ ඈ යන වගු වෙනුවට මෙම *ගැසට් පත්‍රයේ* උපලේඛනයෙහි සඳහන් අ, අ (i), ආ, ඇ සහ ඈ වගු ආදේශ කිරීම මගින් සංශෝධනය කරනු ලැබේ.

**අනුර කුමාර දිසානායක,**
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය.

2025 අප්‍රේල් මස 01 වැනි දින,
කොළඹ 01,
මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ දී ය.

**උපලේඛනය**

අ - වගුව

*(4 වැනි නියෝගය)*

**එන ජාත්‍යන්තර ඇමතුම් මත ගෙවිය යුතු බදු අනුප්‍රමාණය**

| *වර්ෂය* | *කාල පරිච්ඡේදය* | *ගාස්තුව (මිනිත්තුවකට ඇ. ඩො. ශත)* |
|---|---|---|
| 2025 | 2025.01.01. - 2025.12.31 | 12.00 |
| 2026 | 2026.01.01. - 2026.12.31 | 12.00 |
| 2027 | 2027.01.01. - 2027.12.31 | 12.00 |

1A - PG 7073 — 404 (2025/04)
මෙම අති විශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

## උපලේඛනය (සම්බන්ධිතයි)

### අ(i) - වගුව

*(4අ, 7 සහ 8 වැනි නියෝගය)*

**විශේෂිත දුරකථන අංක (වි. දු. අ.) සඳහා එන ජාත්‍යන්තර ඇමතුම් මත ගෙවිය යුතු බදු අනුප්‍රමාණය**

| වර්ෂය | කාල පරිච්ඡේදය | එක දුරකථන අංකයක් සඳහා මසකට අය කිරීම (ඇ. ඩො.) | මසකට මිනිත්තු 1500 ඉක්මවූ විට අය කිරීම (ඇ. ඩො. ශත) |
|---|---|---|---|
| 2025 | 2025.01.01. - 2025.12.31 | 3.00 | සෑම අමතර මිනිත්තුවක් සඳහාම 6.00 |
| 2026 | 2026.01.01. - 2026.12.31 | 3.00 | සෑම අමතර මිනිත්තුවක් සඳහාම 6.00 |
| 2027 | 2027.01.01. - 2027.12.31 | 3.00 | සෑම අමතර මිනිත්තුවක් සඳහාම 6.00 |

### ආ - වගුව

*(5 වැනි නියෝගය)*

**එන දේශිය ප්‍රවේශ ගාස්තු (එ. දේ. ප්‍ර. ගා.) වශයෙන් වූ බදු බෙදාහැරීමේ අනුප්‍රමාණය**

| වර්ෂය | කාල පරිච්ඡේදය | ගාස්තුව (මිනිත්තුවකට ඇ. ඩො. ශත) |
|---|---|---|
| 2025 | 2025.01.01. - 2025.12.31 | 6.00 |
| 2026 | 2026.01.01. - 2026.12.31 | 6.00 |
| 2027 | 2027.01.01. - 2027.12.31 | 6.00 |

### ඇ - වගුව

*(5, 7 සහ 8 වැනි නියෝග)*

**විදුලි සංදේශ සංවර්ධන ගාස්තුව (වි. සං. ස. ගා.) වශයෙන් වූ බදු බෙදාහැරීමේ අනුප්‍රමාණය**

| වර්ෂය | කාල පරිච්ඡේදය | ගාස්තුව (මිනිත්තුවකට ඇ. ඩො. ශත) |
|---|---|---|
| 2025 | 2025.01.01. - 2025.12.31 | 6.00 |
| 2026 | 2026.01.01. - 2026.12.31 | 6.00 |
| 2027 | 2027.01.01. - 2027.12.31 | 6.00 |

### ඈ - වගුව

*(9 සහ 9 (අ) වැනි නියෝග)*

**යන දේශීය ප්‍රවේශ ගාස්තු (ය. දේ. ප්‍ර. ගා.) මත ගෙවිය යුතු බදු අනුප්‍රමාණය**

| වර්ෂය | කාල පරිච්ඡේදය | එක් මිනිත්තුවක් සඳහා අය කිරීම (ශ්‍රී ලංකා රුපියල්) |
|---|---|---|
| 2025 | 2025.01.01. - 2025.12.31 | 0.00 |
| 2026 | 2026.01.01. - 2026.12.31 | 0.00 |
| 2027 | 2027.01.01. - 2027.12.31 | 0.00 |

EOG 04 - 0016

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.